

# දරුවෙකුට මව් පිය සෙනෙහස වඩාත් වැදගත් වන්නේ ඇයි?

## දෙස් - විදෙස් දැනුමින් පොහොසත් උපදේශන මනෝ විද්‍යාඥ ප්‍රසන්න පණ්ඩිතරත්න ගෙන් ඒ ගැන අහමු...



ප්‍රසන්න පණ්ඩිතරත්න යනු දේශීයවත්, ජාත්‍යන්තරවත් ලියාපදිංචි වූ උපදේශන මනෝ විද්‍යාඥයෙකි. ශ්‍රී ලංකාවේදී මනෝ විද්‍යාව හා උපදේශනය පිළිබඳව ගෞරව ඩිප්ලෝමා සහතික ලත් ප්‍රසන්න මනෝ විද්‍යාව පිළිබඳව ද්විත්ව උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ පශ්චාත් ද්විත්ව උපාධිය ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවියෙන් ලබා ඇත. ඊට අමතරව මේ වන විට මනෝ විද්‍යාව පිළිබඳව ආචාර්ය උපාධිය වෙනුවෙන් අවසන් වසරේ අධ්‍යාපන කටයුතු වල නියැලී සිටින ඔහු මෝහන විද්‍යාව පිළිබඳව ඩිප්ලෝමාධාරියෙකි. මේ සියල්ල වෙතින් ලත් දැනුම උපයෝගී කරගෙන ප්‍රායෝගිකව බොහෝ දේ ප්‍රකාශයට පත් කොට ඇති ප්‍රසන්න පසුගිය දිනෙක කෙටි නිවාඩුවක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණියා. පැමිණි ගමනේදී අපි ඔහු සමග කතා කළේ දරුවකුට මව්පිය සෙනෙහස අද වඩාත් වැදගත් වන්නේ ඇයි යන කාරණය පිළිබඳවයි. මව් සෙනෙහස නොදත් දරුවන් අතහැර යන සමහර අම්මලා, මේ සමයේදී අපට හමුවෙයි. එමෙන්ම උපදින්නට සිටින දරුවන් ගබ්සා කරන්නැයි කියා බිරිඳට බල කරන පිය සෙනෙහස නොදත් පුරුෂයින්ද මේ සමාජයේදී අපට හමුවෙයි. ඒ සියලු දෙනාට මෙන්ම මා පිය සෙනෙහස සහ මානව සංහතියට ගරු කරන සියලු දෙනාට ප්‍රසන්නගේ මේ අදහස් වඩාත් ඵලදායී වේවි.

අප සමාජයේ වෙසෙන මව්පියන් ගේ ගති පැවතුම් අනුව කොටස් කීපයකට වර්ග කළ හැකියි. මුලින්ම අපි ඒ ගැන කතා කරමු.

**අධිපතිවාදී නැතිනම් ආධිපත්‍යමය මව්පියන්**
(Authoritarian Parenting)

මෙවැනි ගති ලක්ෂණ ඇති මව්පියන් ළමුන්ගේ වැඩීමට, සිතීමට, ක්‍රියාකාරකම් වලට සෘජුවම බලපෑම් කරයි. ඒ අණසක නිසා ළමුන් වැඩෙන්නේ විශාල මානසික පීඩනයක් ඇතිවයි. මේ නිසා සුහද සාකච්ඡා අවම මට්ටමක පවතී. නීති බිඳ දැමූ විට තදබල ලෙස පහරදීම, පරුෂ වචන භාවිතය, බාධක තහංචි පැනවීම නිසා කුඩා මනස විශාල ලෙස චංචලව පවතී.

මෙවැනි පසුබිමක වැඩෙන දරුවකු තර්කානුකූලව සිතීමට දුර්වල වීම, අසතුටින් ජීවිතය ගත කිරීම, යහළු යෙහෙළියන් අවම වීම හෝ ඔවුන් අතර ප්‍රසිද්ධ නොවීම, විවිධ සමාජ ක්‍රියාකාරකම්වලදී පිටුපසින් සිටීම, මානසික රෝග, චර්ම රෝග, ආහාර ගැනීමේ අයහපත් පුරුදු, පසුකාලීනව නොයෙකුත් මැර ක්‍රියාකාරකම්වල යෙදීම, දිවිනසා ගැනීම ඇතුළු අමානුෂික ආකාරයෙන් සමාජය දෙස බැලීමේ පුරුදු ඇති අය වීමට පුළුවනි. (සමීක්ෂණ වලින් හෙළි කරගත් කරුණු අනුව)

**බාධා නොපමුණුවන මව්පියන්**
(Indulgent parenting)

මෙවැනි මව්පියන් සුලභව දැකගත හැක. මව්පියන් මුළුමනින්ම දරුවාගේ කටයුතුවල යෙදෙමින් කිසිදු පාලනයකින්, දඬුවමකින් තොරව ඉල්ලන දේ කිසිම පැකිලීමකින් තොරව දීමට මැලි නොවෙති. මෙවැනි වාතාවරණයන් යටතේ ඇති දැඩිවන දරුවා සමාජ හැකියාවන් සහ ස්වයං පාලනය අවම මට්ටමක පවතින අයෙකු විය හැකියි. ළමුන් ඉල්ලන සියල්ල මව්පියන් ලබා දෙන නිසා ළමුන් තම චර්යාව පාලනය කිරීමට ඉගෙන ගන්නේ නැත.

මෙයින් සිදුවන්නේ පසුකාලීනව තමාට අවශ්‍ය දේ නොලැබී ගිය කල මේ ළමුන්ට තම ආවේග පාලනය කර ගැනීමට අපහසු වීමයි. ඒ නිසා පාලනය කිරීමට උත්සාහා දැරීම, නීති රීති වලට ආචාර ධර්ම වලට, තැකීමක් නොකිරීම සහ අවසාන සමාජයට වැඩදායී නොවන පුද්ගලයකු විය හැකිය.

රුවන් වලා දුහුල් කඩින්
පෙරේ සඳේ රිදී කැළුම්
තුෂාර හාර හා එකී
ගලා හැලෙනවා...
පුතුගේ සිඟිති දෙතොල් වලට
සිනා ගෙනෙනවා...//
ආනෝතත්ත නෙළුම් විලේ
පාවෙන මල් රේණු වලින්
සුවඳ උරා හෙමින් හෙමින්
සුළං ඇදෙනවා.....
සඳුන් සෙමෙර සලා පුතුට
පවන් සලනවා...//
අතු අග මල් කුමාරියන්
බිඟුමිණි දැල් සැලෙන හඬින්
නිදන පුතුගෙ කණට මිහිරි
කතා කියනවා...
සිහින ලොවේ ළපටි සිහින
සිතේ ඇඳෙනවා...//
රාජ ඉසුරු බරට වඩින
වාසනාව කිරුළු දරන
මාලිගාව එළිය කරන
බිළිදු නිදනවා
සීත නලින සිහින ලොවක
බිළිඳු වඩිනවා...//

ඩී.සී.එල් අමරසිංහගේ 'වෙසතුරු සිරිත' චිත්‍රපටය වෙනුවෙන් නැසීගිය මහගම සේකර ශූරීන්ගේ පද වැලට පණ්ඩිත් අමරදේවයන්ගේ සංගීතය යටතේ විශාරද නන්දා මාලිනිය ගැයූ ගීයකි.



**නොසලකා හරිනු ලබන මව්පියන්**
(Neglectful parenting)

මෙවැනි මව්පියන් ළමුන්ගේ ශාරීරික හා මානසික වර්ධනයට කෙසේවත් දායක නොවන අය වන අතර ළමුන්ගේ ජීවිතයේ ප්‍රධාන අවස්ථා පිළිබඳව වැටහීමක් හෝ තැකීමක් නැත. අනෙක් අය ඉදිරියේ මේ දරුවා මගේ නොවේ. මම එනකොට ගෙනාවෙත් නැහැ කියා කීමට තරම් මැලි නොවෙති.

මෙවැනි මව්පියන් යටතේ වැඩෙන දරුවන් තමාට සමාජයේ සුදුසු තැන පිළිබඳව මෙන්ම තම පවුලේ තැනක් හෝ මව්පියන්ට තමාව අවශ්‍යද යන්න පිළිබඳව විශාල බියකින් පසුවෙයි. තමාගේ පැවැත්ම පිළිබඳ විවිධාකාර ප්‍රශ්න මෙන්ම අවිනිශ්චිත බව ඔහු ඉදිරියේ මැවෙයි.

ශාරීරික හා මානසික ක්‍රියාකාරකම් වලදී මේ ළමුන් අනෙක් අයට වඩා පසු පසින් සිටී. තම ස්ව හැකියාව ගැන වැටහීමක්, පිළිගැනීමක් නැත. සමහර විට මව්පිය අවධානය ලබා ගැනීම උදෙසා භයානක කටයුතු වල නිරතවීම මෙන්ම ශාරීරික මෙන්ම මානසික වර්ධනයේ අඩුවක් වීමටත් පුළුවන. විවිධ අංග චලන නිසා බහුතරයකගේ අවධානයට ලක්වන මොවුන් අධ්‍යාපන කටයුතු වලදී දක්ෂ නොවීමට ඉඩ තිබේ.

**ස්වාධීනත්වය අගයන මව්පියන්**
(Authoritative parenting)

මෙවැනි මව්පියන් යටතේ වැඩෙන ළමුන්ට මව්පියන් නිරන්තරයෙන්ම ස්වයං තීරණ ගැනීමට උනන්දු කරවන අතර, ළමුන්ගේ සමහර තීරණ වලදී කල්පනාකාරීව මැදිහත්වීම් සිදුකරයි. මව්පියන් මැදිහත් වීම් කළ විට හේතු නොපැකිළිව ගෙන හැර පාන අතර ළමයා දක්ෂ දේ, කැමති දේ සඳහා ධෛර්‍යමත් කිරීමට, පැසසීමට සිදු කරයි. අවස්ථානුකූලව යම් යම් ක්‍රියාකාරකම් වලදී ඊටත් වඩා පහසුවෙන් එය කර දීමට හැකි මාර්ග දරුවන්ට පෙන්වා දෙයි. ධනාත්මකව ලෝකය දෙස බැලීමට ආදර්ශයෙන් හා වචනයෙන් ළමයින්ට ඉඩ සලසා දෙයි.

මෙවැනි මව්පියන්ගේ ළමුන් අනෙක් අයගේ ළමුන්ට වඩා දැනුමෙන්, ක්‍රියාකාරකම් වලින් ආත්ම අභිමානයෙන් සහ නිරෝගීභාවයෙන් ඉදිරියෙන් සිටී.

තර්කානුකූලව හා සන්සුන්ව ජීවිතයේ විවිධ බාධක ජය ගැනීමටත්, ජීවිතය තුළ සතුටින් සිටීමටත්, ජීවිතය සැබෑ ලෙස ආස්වාදය කිරීමේ ශක්තියත් මොවුන් තුළ පවතී. ආත්ම අභිමානය සහ ධනාත්මක බව මෙන්ම සැහැල්ලු බව ප්‍රකාශ වේ.

**සැලකිය යුතුයි**

මෙකී සඳහන් අයුරින් මව්පියන් ළමුන්ට සලකන ආකාරයන් කිසි ලෙසකින්වත් අවඥාවට ලක් නොකළ යුතු බව ප්‍රසන්න පවසයි. එලෙසම මව්පියන් විවිධාකාර වූ අයුරින්ම අයහපත් ළමුන් සමාජයට දායාද නොවන බවත් ඔහු පවසයි. එමෙන්ම බහුතරයක් මව්පියන් බොහෝ විට ඉහත සඳහන් ගති පැවතුම් අතර මිශ්‍ර විධි භාවිත කිරීමට පුළුවන. සෑම මව්පියකුගේම උත්සාහය තමාටත් තම ළමුන්ටත් සුබවාදී පවුල් පරිසරයක් ගොඩ නැගීම නම්, එයින් සමාජයට මෙන්ම පවුලට ලැබෙන ප්‍රතිලාභය ඉමහත්ය.

**එසේ නම් දරුවකුට මව් පිය සෙනෙහස වඩා වැදගත් ඇයි?**

අද සමාජයේ විකාශය අනුව පවුල් ඒකක කුඩා වී තිබේ. එනිසා පවුලේ එකම දරුවාට හෝ දරු දෙදෙනාට මව්පියන් පණ මෙන් ආදරය කරයි. එය බුද්ධිමත්ව ලබාදීම කළ යුතුය. ආදරය සෙනෙහස නිසා දරුවන්ගේ බුද්ධි වර්ධනය මෙන්ම ක්‍රියාකාරකම්ද ඉහළ යයි. මව්පියන් සන්සුන් වන තරමට ඒ නිවස පසන් නිවසකි. ගෙදර නොසන්සුන්කාරී වාතාවරණය, පරිසරය මාරු කිරීම, මව්පියන්ගෙන් තොරව දරුවා වැඩීම කිසිසේත් යහපත් නැත. එමගින් පෞරුෂය හීන වීමට පුළුවන. පිරිමි ළමයකු අම්මා කෙරෙහි දැඩි බැඳීමක් ඇති බවත් ගැහැනු දරුවකු තාත්තාට වැඩිපුර බැඳීමක් ඇති බවත් සමීක්ෂණ වාර්තා අනුව පැවසීමට පුළුවන. සත්තකින්ම දරුවකුට මව්පිය දෙදෙනා තරම් උතුම් සම්පතක් නැත. මව ළමයකු නිෂ්ප්‍රභ කරනවා නම් පියා ළමයා නිෂ්ප්‍රභ කරනවා නම්, ළමයෙකු ලබන අමිහිරිම දේ එයයි. මව පියා අතරින් මවගේ සෙනෙහස දරුවකුට වඩාත් වැදගත් වන්නේ දරුවකු මව කෙරෙහි උපදින්නට පෙර සිටම තිබෙන බැඳීම නිසයි. දස මසක් කුස දරා සිටින මවගේ ගඳ-සුවඳ මෙන්ම ස්පර්ශය ස්වභාවයෙන්ම ඇතිවන දෙයකි. මේ සියල්ල නිසා දරුවකු මවකට වඩාත් සමීපය. මවගේ සෙනෙහස තරම් උතුම් දෙයක් තවත් නැතැයි කියන්නෙත් මේ හේතු නිසාමය. තවද දරුවකු වෙනුවෙන් ඔහු අනාගතයේ ලෝකයට වැඩදායී පුද්ගලයකු කිරීමට ආත්ම කැපවීමෙන් ක්‍රියා කරන මවට පියාට ජීවිතය සැබෑ ලෙසම වින්දනය කිරීමේ භාග්‍ය ලැබෙයි.

☑ සඳුන් ගමගේ